ප්‍රධාන ලේකම් කාර්යාලය - බස්නාහිර පළාත
பிரதான செயலாளர் அலுவலகம் - மேல் மாகாணம்
OFFICE OF THE CHIEF SECRETARY - WESTERN PROVINCE
204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල. | 204, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்ல. | 204, Denzil Kobbekaduwa Mawatha, Battaramulla.

මගේ අංකය / எனது இலக்கம் / My No. } CSWP/FIN-AP/03/FI/18(A)    ඔබේ අංකය / உமது இலக்கம் / Your No. }    දිනය / திகதி / Date } 2026.03.26

## මූල්‍ය චක්‍රලේඛ 03/2026

ආණ්ඩුකාර ලේකම්(බ.ප.),

සභා ලේකම් (බ.ප.),

පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම් (බ.ප.)

සියළුම අමාත්‍යාංශ ලේකම්වරු (බ.ප.),

ප්‍රාදේශිය ලේකම්වරුන් (බ.ප.),

සියළුම දෙපාර්තමේන්තු ප්‍රධානීන් (බ.ප.),

සමූපකාර සේවක කොමිෂන් සභා ලේකම් (බ.ප.),

ව්‍යවස්ථාපිත අධිකාරි වල සභාපතිවරු (බ.ප.)

**රජයේ මූල්‍ය නොවන වත්කම් කළමනාකරණය**

**මූල්‍ය නොවන වත්කම් කළමනාකරණ පද්ධතිය (NFAMS) - වාහන මොඩියුලය විගණනය**

භාණ්ඩාගාර ලේකම්ගේ අංක : CGO/ASM/Policy/Cir/(VOL III) හා 2026.01.22 දිනැතිව නිකුත් කරන ලද **වත්කම් කළමනාකරණ චක්‍රලේඛ** අංක : **01/2026** හි හි පිපිටපතක් මේ සමඟ අමුණා ඇත.

02. ආණ්ඩුකාර ලේකම්ගේ අංක : GOS/ADM/6/2/19-2026 හා 2026.03.17 දිනැති ලිපිය මඟින් ඉහත චක්‍රලේඛයෙහි විධි විධාන පහත සඳහන් සංශෝධන සහිතව 2026.02.26 දින සිට බස්නාහිර පළාත් සභාවට අදාල කරගැනීම සඳහා ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලැබී ඇති බව දැනුම් දී ඇත. එහෙයින් එම චක්‍රලේඛයෙහි සඳහන් විවිධාන ප්‍රකාරව කටයුතු කරන මෙන් කාරුණිකව දන්වමි.

ඉහත සඳහන් චක්‍රලේඛයෙහි,

03. (i) (ආ) " රාජ්‍ය ආයතනයෙහි ප්‍රධානියා විසින් " වෙනුවට " ප්‍රධාන අභ්‍යන්තර විගණක විසින් බස්නාහිර පළාතේ " ලෙස සංශෝධනය වීම හා

* එසේම චක්‍රලේඛයේ අවසානයෙහි " **එසේම දුරකථන අංක 011-2092643 හා අභ්‍යන්තර දුරකථන දිගු 3380/3386 මඟින් ප්‍රධාන ලේකම් කාර්යාලීය මූල්‍ය අංශය මඟින් විමසිය හැකිවේ."** යනුවෙන් ඇතුළත් විය යුතුය.

කේ.ජී. ප්‍රදීප් පුෂ්ප කුමාර,
ප්‍රධාන ලේකම්,
පළාත් මුදල් අමාත්‍යාංශ ලේකම් හා
පළාත් භාණ්ඩාගාර ලේකම්
බස්නාහිර පළාත.

දුරකථන : 0112-093416
ෆැක්ස් : 0112-092636
විද්‍යුත් ලිපිනය : accpay@cs.wpc.gov.lk

පිටපත: 01.විගණකාධිපති
02.අධ්‍යක්ෂ (අභ්‍යන්තර විගණන)
03.තොරතුරු තාක්ෂණ නිලධාරී.

මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය
நிதி, திட்டமிடல் மற்றும் பொருளாதார அபிவிருத்தி அமைச்சு
MINISTRY OF FINANCE, PLANNING AND ECONOMIC DEVELOPMENT

මහලේකම් කාර්යාලය, කොළඹ 01, ශ්‍රී ලංකාව. | செயலகம், கொழும்பு 01. இலங்கை. | The Secretariat, Colombo 01. Sri Lanka.

කාර්යාලය / அலுவலகம் / Office: 011 - 2484500, 011 - 2484600, 011 - 2484700
ෆැක්ස් / தொலைநகல் / Fax: 011 - 2449823
වෙබ් අඩවිය / இணையத்தளம் / Website: www.treasury.gov.lk

මගේ අංකය / எனது இல. / My No.: CGO/ASM/Policy/Cir/ (VOL III)
ඔබේ අංකය / உமது இல. / Your No.:
දිනය / திகதி / Date: 2026.01.22

**වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක 01/2026**

**සියලුම:** **අමාත්‍යාංශ ලේකම්වරුන්**
**පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්**
**දෙපාර්තමේන්තු ප්‍රධානීන්**
**විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා සභාපති සහ විශ්වවිද්‍යාල උපකුලපතිවරුන්**
**රාජ්‍ය සංස්ථා සහ ව්‍යවස්ථාපිත මණ්ඩල ප්‍රධානීන්**
**රාජ්‍ය බැංකු හා රාජ්‍ය සමාගම් සභාපතිවරුන්**

**රජයේ මූල්‍ය නොවන වත්කම් කළමනාකරණය**

**මූල්‍ය නොවන වත්කම් කළමනාකරණ පද්ධතිය (NFAMS) - වාහන මොඩියුලය විගණනය**

වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක 06/2023 නිකුත් කරමින්, මූල්‍ය නොවන වත්කම් කළමනාකරණ පද්ධතිය (NFAMS) හි පළමු මොඩියුලය (වාහන මොඩියුලය) 2023 සැප්තැම්බර් 01 දින සිට ක්‍රියාත්මක කරමින් මෙම පද්ධතිය ස්ථාපිත කර ඇත.

02. ඒ අනුව, වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක 01/2017 හා එයට ආනුශාංගික චක්‍රලේඛ මගින් පැතුරුම්පත් (Spread Sheet) පදනම් කරගෙන මෙම වත්කම් කළමනාකරණය සඳහා තොරතුරු ලේඛනගත කිරීම හා වාර්තා කිරීම සඳහා අනුගමනය කළ ක්‍රමවේදය, වෙබ් පාදක (web-based) තත්‍යකාලීන දත්ත වාර්තා කරනු ලබන ක්‍රමවේදයට වැඩි දියුණු කර ඇත. එබැවින්, NFAMS පද්ධතියේ අදාළ මොඩියුල ක්‍රමානුකූලව ක්‍රියාත්මක කරන පරිදි, සියලුම රාජ්‍ය ආයතන වල ප්‍රධානීන් විසින්, මෙම වත්කම් පිළිබඳ තොරතුරු වාර්තා කිරීම අවශ්‍ය වේ. සෑම රාජ්‍ය ආයතනයකටම මූල්‍ය නොවන වත්කම් පිළිබඳ තොරතුරු වෙබ් පාදක පද්ධතියක (web-based platform) වාර්තා කර පවත්වා ගැනීමට මෙම පද්ධතිය මගින් පහසුකම් සලසනු ඇත.

03. විගණන කටයුතු සඳහා සහ සෑම රාජ්‍ය ආයතනයක් විසින් ම NFAMS පද්ධතියේ වාහන ලියාපදිංචි කිරීම සහ අදාළ තත්‍යකාලීන දත්ත වාර්තා කිරීමේ නිරවද්‍යතාවය තවදුරටත් තහවුරු කිරීම සඳහා, මෙම පද්ධතියේ විගණන පහසුකම පහත සඳහන් පරිදි සලසනු ලබයි:

(i) පරිශීලකයන් ලියාපදිංචි කිරීම: ඒ සඳහා වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක 06/2023 හි CGO/NFAMS/G/01 ආකෘතිය නිසිලෙස සම්පූර්ණ කර NFAMS පද්ධතියට උඩුගත කළ යුතු වේ:

(අ) විගණකාධිපති විසින් අදාළ ආයතනය සඳහා NFAMS හි විගණන නිලධාරි නම් කිරීමට,

(ආ) රාජ්‍ය ආයතනයෙහි ප්‍රධානියා විසින් අදාළ ආයතනය සඳහා NFAMS හි අභ්‍යන්තර විගණන නිලධාරි නම් කිරීමට.

(ii) ප්‍රධාන ආයතනය (Parent institution) සඳහා වන විගණන නිලධාරි / අභ්‍යන්තර විගණන නිලධාරි හට එහි උප ආයතන (Child institutions) වලට අදාළ NFAMS හි වාර්තා වන තොරතුරු විගණනය කිරීම අවශ්‍ය වන්නේ නම්, එම පහසුකම ලබා දීම සඳහා කොම්ප්ට්‍රෝලර් ජනරාල්ගේ පූර්ව අනුමැතිය ලබාගත යුතු වේ.

04. NFAMS පද්ධතියෙහි අනෙකුත් මූල්‍ය නොවන වත්කම් පිළිබඳ මොඩියුල ක්‍රියාත්මක කර, ඒ අනුව රාජ්‍ය ආයතන විසින් එම වත්කම් පිළිබඳ තොරතුරු වාර්තා කළ පසු අදාළ මොඩියුල සඳහා වන විගණන පහසුකම ලබා දෙනු ලැබේ.

05. NFAMS වෙත පිවිසීමට සහ අදාල වක්‍රලේඛ පරිශීලනය කිරීම සඳහා, පහත දක්වා ඇති QR කේතය පරිලෝකනය කිරීම (scan) හෝ https://systems.treasury.gov.lk වෙබ් පිවිසුම භාවිතා කිරීම සිදු කරන්න.

අත්.කළේ / ආචාර්ය හර්ෂණ සූරියප්පෙරුම
භාණ්ඩාගාර ලේකම්

පිටපත්:
1. ජනාධිපති ලේකම්
2. අග්‍රාමාත්‍ය ලේකම්
3. අමාත්‍ය මණ්ඩල ලේකම්
4. විගණකාධිපති

SCAN HERE TO LOGIN NFAMS

(මේ පිළිබඳව පැහැදිලි කර ගැනීම් අවශ්‍ය වේ නම්, දුරකථන අංක: 011-2484583, 011-2151425 මගින් කොම්ප්ට්‍රෝලර් ජනරාල් විමසීම හෝ nfams@mo.treasury.gov.lk හරහා ඉල්ලීම් ඉදිරිපත් කිරීම කළ හැකි වේ.)